# සිංහලයේ "ෆ" ශබ්ද සංකේතයේ සුලමුල

කරුණාරත්න අමරසිංහ

'ෆ' සලකුණ අලුත නිපදවා ගත්තක් ය යන වැරදි මතය ඒ පිළිබඳ කරුණු නොදත්තන් අතර පැතිර පවතී. ඒ බැවින් මෙහි ඉතිහාසය සොයා බැලීම ශාස්ත්‍රීය වශයෙන් වැදගත් කාරියක් වෙයි.

'ෆ' සලකුණේ ඉතිහාසය වෛද කාලය දක්වා දිව ගිය ද එය ඉංග්‍රීසි 'f' ශබ්දය සඳහා සුදුසු සලකුණ ලෙස සම්මත කොට ගෙන සිංහල හෝඩියට ඇතුළු කරන ලද්දේ ජාතික අධ්‍යාපන ආයතනයේ පර්යේෂණ අංශය සමග එක් ව 1989 දී 'සිංහල ලේඛන රීතිය' ග්‍රන්ථය සම්පාදනය කරන ලද තත්ත්වඥ මණ්ඩලය විසිනි. මෙ "තත්ත්වඥ මණ්ඩලයට ද, යළි සාකච්ඡා කොට (ග්‍රන්ථය) අනුමත කළ ශාස්ත්‍රීය පර්ෂදයට ද, ව්‍යාපෘති කාර්ය මණ්ඩලයට ද අයත් ගිහි පැවිදි වියතුන් අතර පේරාදෙණිය, ශ්‍රී ජයවර්ධනපුර, කැලණිය, කොළඹ සහ රුහුණ යන විශ්වවිද්‍යාලවල සිංහල අධ්‍යයනාංශයන් හි මහාචාර්යවරු ද සුප්‍රසිද්ධ විද්‍යාඥයෝ ද ලේඛකයෝ ද සන්නිවේදන මාධ්‍ය ප්‍රවීණයෝ ද අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ ජාතික අධ්‍යාපන ආයතනයේ සහ විභාග දෙපාර්තමේන්තුවේ සිංහල භාෂා කටයුතුවල නියුක්ත නිලධාරීහු ද වූහ." (සිංහල ලේඛන රීතිය - 1989 - පෙරවදන vi පි)

"සිංහල ලේඛන රීතිය" වැනි පොතක් පළ කිරීමට තුඩු දුන් ප්‍රධාන හේතුව ඒ පොතේ පෙරවදන මඟින් පැහැදිලි කොට ඇත්තේ මෙසේ ය.

"පාසල් ශිෂ්‍යයන් ගේ පමණක් නොව ලේඛනයෙහි යෙදුණු උසස්තරයන් ගේ රචනාවල පවා ව්‍යාකූලත්වයෙන් ද ව්‍යාකරණ දෝෂයෙන් ද යුත් යෙදුම් දිගට ම පෙනෙන්නට වූයේ